සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

61 | S | I

11 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 මහාද්වීපික කබොල ............................ පාෂාණ වලින් සමන්විත වේ. (ග්‍රැනයිට් / බැසෝල්ට් / ඩොලමයිට්)

02 පෘථිවි වායුගෝලයේ අඩුම උෂ්ණත්වයක් පවතිනේ ........................................................................ තුළ ය. (පරිවර්තීගෝලය / අපරිවර්තීගෝලය / මෙසෝගෝලය)

03 ලොව ගැඹුරුම විල වන බයිකල් විල ................................................................... මහාද්වීපය තුළ පිහිටා ඇත. (යුරෝපා / ආසියා / අප්‍රිකා)

04 .............................................................................. ශ්‍රී ලංකාවේ ගංගා මිටියාවත් ආශ්‍රිතව ව්‍යාප්තව පවතී. (දියළු පස / රතු දුඹුරු පස / රෙගසෝල් පස)

05 වර්තමානය වන විට ලොව වැඩිම ජනගහනයක් ජීවත් වන රට ................................................................ යි. (චීනය / ඉන්දියාව / ඉන්දුනීසියාව)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

06 මිරිදිය ජලයෙන් 20% ක් භූගත ජලය ලෙස පවතී. ( නි / වැ )

07 ඉතාලියේ මරේ ඩාලිං නිම්නය ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයකි. ( නි / වැ )

08 මහනුවර අයත් වන්නේ මධ්‍යම කඳුකර සංචාරක කලාපයට ය. ( නි / වැ )

09 පෙට්‍රෝ රසායන කර්මාන්තයේ අමුද්‍රව්‍ය වන්නේ පෙට්‍රෝලියම් පිරිපහදුවෙන් ඉතිරි වන ද්‍රව්‍යයන් ය. ( නි / වැ )

10 ශ්‍රී ලංකාවට අයත් රාජ්‍රීය මුහුදු සීමාව නාවික සැතපුම් 12 නොඉක්මවයි. ( නි / වැ )

- **ප්‍රශ්න අංක 11 සිට 16 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11 උතුරු අක්ෂාංශ $50^0$ - $60^0$ අතර කලාපයේ ................................................................ වනාන්තර ව්‍යාප්තව පවතී.

12 යකඩ හා වානේ වලට තිබූ ඉල්ලුම .......................... සොයා ගැනීමත් සමග 65% ක් පමණ දක්වා අඩු විය.


13 ලෝම් හා ...................................................................................... පස තේ වගාව සඳහා වඩාත් සුදුසු වේ.

14 යපස්, මැංගනීස්, තඹ වැනි ඛනිජ .................................................................... ඛනිජ ගනයට අයත් වේ.

15 භූ ලක්ෂණ සිතියම් වල මායිම් වර්ග දැක්වීම සඳහා .......................................... වර්ණය යොදා ගෙන ඇත.

16 පෘථිවි ශිලාගෝලය විශාල භූ තැටි ..................................................................... කින් සමන්විත වේ.

- **ප්‍රශ්න අංක 17 සිට 19 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත ප්‍රස්ථාර සටහන උපයෝගී තර කරගන්න.**




17 වැඩිම අපනයන පරිමාවක් හා අපනයනය වටිනාකමක් වාර්තා වන්නේ ....................................... වසරේ ය.

18 අපනයන පරිමාව අඩු වුවද අපනයන වටිනාකම ඉහළ අගයක් දක්නට ලැබෙන්නේ ....................................... වසරේ ය.

19 අඩුම අපනයන වටිනාකමක් ලැබී ඇත්තේ ............................................................................ වසර තුළ ය.

- **ප්‍රශ්න අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20

| 'අ' **දූවැන්ත නගරය** | | 'ආ' **පිහිටි රට** | |
|---|---|---|---|
| (1) | ෂැංහයි | A | බ්‍රසීලය |
| (2) | රියෝද ජැනයිරෝ | B | චීනය |
| (3) | නිව්යෝර්ක් | C | එක්සත් රාජධානිය |
| | | D | ඇමරිකා එක්සත් ජනපදය |

(1) C, A, D (2) D, A, C (3) B, C, D (4) B, A, D (.........)

21

| 'අ' **සමුද්‍ර සන්ධිය** | | 'ආ' **පිහිටා ඇති ස්ථානය** | |
|---|---|---|---|
| (1) | බාස් සමුද්‍ර සන්ධිය | A | ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර |
| (2) | පෝක් සමුද්‍ර සන්ධිය | B | චීනය හා තායිවානය අතර |
| (3) | මලක්කා සමුද්‍ර සන්ධිය | C | ඕස්ට්‍රේලියාව හා තස්මේනියාව අතර |
| | | D | මැලේසියාව හා ඉන්දුනීසියාව අතර |

(1) D, A, B (2) B, A, D (3) C, A, D (4) B, A, C (.........)

22 'අ' 'ආ'

| 'අ' ඛනිජ වර්ගය | 'ආ' කරන නිෂ්පාදනය |
|---|---|
| (1) හුණුගල් | A වීදුරු |
| (2) සිලිකා වැලි | B ඔරලෝසු බෙයාරිං |
| (3) මිනිරන් | C තීන්ත වර්ග |
| | D සිමෙන්ති |

(1) D, C, B (2) D, A, C (3) C, A, D (4) B, A, D (.........)

23

| 'අ' මතුපිට ජල ප්‍රතිශතය | 'ආ' පවතින ස්ථාන |
|---|---|
| (1) 8% | A වායුගෝලය තුළ |
| (2) 38% | B පාංශු ජලය |
| (3) 52% | C විල් වල |
| | D ගංගා වල |

(1) A, B, C (2) B, A, C (3) A, C, D (4) D, A, B (.........)

24

| 'අ' විදුලි බලාගාරයේ නම | 'ආ' පිහිටි ප්‍රදේශය |
|---|---|
| (1) තම්බපවනී | A නොරොච්චෝලේ |
| (2) ලක්විජය | B මන්නාරම |
| (3) යුගදනවි | C කෙරවලපිටිය |
| | D සපුගස්කන්ද |

(1) B, A, C (2) D, A, C (3) B, C, A (4) C, A, B (.........)

- **ප්‍රශ්න අංක 25 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

25. බුන්දල ජාතික උද්‍යානය පිහිටා ඇති දිස්ත්‍රික්කය මින් කුමක් ද?
(1) මාතර (2) හම්බන්තොට (3) ගාල්ල (4) කළුතර (.........)

26. 1 : 50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක 9 cm කින් පෙන්වා ඇති මාර්ගයක සැබෑ දිග වන්නේ,
(1) 5.5 km කි. (2) 5 km කි. (3) 4.5 km කි. (4) 4.18 km කි. (.........)

27. ශ්‍රී ලංකාවේ වී වගාකරනු ලබන අතරමැදි කලාපයට අයත් දිස්ත්‍රික්කයකි,
(1) අනුරාධපුරය (2) ගම්පහ (3) කෑගල්ල (4) කුරුණෑගල (.........)

28. නිෂ්පාදනය සඳහා වැය වන පිරිවැය මෙන් දෙගුණයක් පර්යේෂණ කටයුතු සඳහා වැය කරන කර්මාන්තය කුමක් ද?
(1) යකඩ හා වානේ (2) මෝටර් රථ
(3) නැව් තැනීම (4) විද්‍යුත් කර්මාන්තය (.........)

29. බෝඹුවල ප්‍රදේශයේ පිහිටා ඇත්තේ,
(1) පොල් පර්යේෂණ ආයතනයකි. (2) බුලත් අපනයන ගම්මානයකි.
(3) වී පර්යේෂණ ආයතනයකි. (4) ආර්ථික මධ්‍යස්ථානයකි. (.........)

30. ඇමර්සන්, කොංගෝ ද්‍රෝණි ප්‍රදේශ ජන හීන ප්‍රදේශ බවට පත් වීමට බලපා ඇති හේතුව මින් කුමක් ද?
(1) අඩු උෂ්ණත්වයයි. (2) අධික වර්ෂාපතනය යි.
(3) රළු භූ විෂමතාවයයි. (4) අධික ශීතල යි. (.........)

31. තිරිඟු වගාව සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අධික ජන සංඛ්‍යාවක් වෙසෙන ප්‍රදේශවල ව්‍යාප්තව පවතී.
(2) දියුණු තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිත කරයි.
(3) විශාල වගා බිම් වල වගා කරයි.
(4) ලොව පුරා පැතිරුණු වෙළඳපොළක් පවතී. (.........)

32. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ,
(1) වරාය පහසුකම් නොමැති වීමයි.
(2) ඉන්දීය ධීවරයින් මෙරට මුහුදු සීමාවේ මසුන් ඇල්ලීමයි.
(3) ධීවර ආම්පන්න වල හිඟතාවය යි.
(4) රාජ්‍ය අනුග්‍රහය ලබා නොදීමයි. (.........)

33. පිඟන් මැටි ව්‍යාප්තව පවතින ප්‍රදේශ දෙකක් නිවැරදිව දක්වෙන පිළිතුර කුමක් ද?
(1) රත්තොට, බෝගල (2) ඔක්කම්පිටිය, බොරලැස්ගමුව
(3) මීටියාගොඩ, බොරලැස්ගමුව (4) මාරවිල, දෙදියවල (.........)

34. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මෝටර් රථ කර්මාන්තය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක තෝරන්න.
A - චීනය එහි ප්‍රමුඛයා බවට පත්වීම.
B - ලෝක මට්ටමින් ඉල්ලුම පහළ බැස තිබීම.
C - කෙටි කලකින් මාදිලිය වෙනස්වීම.
D - විශාල මිනිස් ශ්‍රමයක් අවශ්‍ය වීම.
(1) A හා B (2) A හා D (3) C හා D (4) A හා C (.........)

35. නවතම සංගණනවලට අනුව ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් වෙසෙන දිස්ත්‍රික්ක තුන පිළිවෙලින් දක්වෙන වරණය කුමක් ද?
(1) කොළඹ, ගම්පහ, මහනුවර (2) ගම්පහ, කොළඹ, ගාල්ල
(3) කොළඹ, ගම්පහ, කළුතර (4) ගම්පහ, කොළඹ, කුරුණෑගල (.........)

36. සංවර්ධනය මැනීමේ දී ''ක්‍රය ශක්තිය හා ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය'' නිර්ණායකයක් ලෙස යොදා ගෙන ඇති මිනුම කුමක් ද?
(1) භෞතික ජීවන තත්ව දර්ශකය (2) මානුෂ දරිද්‍රතා දර්ශකය
(3) මානුෂ සංවර්ධන දර්ශකය (4) මානුෂ පීඩන දර්ශකය (.........)

37. අවම උෂ්ණත්වයක් පවතින වායුගෝලීය ස්තරය හා පතන ශීඝ්‍රතා ක්‍රියාවලිය සිදු වන වායුගෝලීය ස්තරය නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.
(1) තාපගෝලය හා පරිවර්තීගෝලය (2) මෙසෝගෝලය හා පරිවර්තීගෝලය
(3) මෙසෝගෝලය හා අපරිවර්තීගෝලය (4) පරිවර්තීගෝලය හා අපරිවර්තීගෝලය (.........)

- **පහත A, B, C හා D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. උන්නතාංශය
2. උෂ්ණත්වය

B - 1. භූමි පරිහරණය
2. නායයාම්

C - 1. ජන සංඛ්‍යාව
2. බිම් ප්‍රමාණය

D - 1. ජල සම්පත
2. පරිසර දූෂණය

38. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.........)

39. දෙවැන්න පළමුවැන්නේ අවිධිමත් බවෙහි ප්‍රතිඵලයක් බවට දක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.........)

40. පළමුවැන්නේ වැඩිවීම හෝ අඩුවීම දෙවැන්න කෙරෙහි බලපෑමක් එල්ල නොවන බවට දක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (.........)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

61 | S | II

**11 ශ්‍රේණිය**

# භූගෝල විද්‍යාව - II

කාලය පැය 02 යි
අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය **I, II** වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- **I** කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
- **II** කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

## I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1: 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- **අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(i) අංක 1 න් දක්වා ඇත්තේ කුමක් ද?

(ත්‍රිකෝණමිතික ස්ථානය / ගල / ගල්වල) (ල.01)

(ii) අංක 2 න් දක්වා ඇත්තේ කුමක් ද?

(තණ බිම / හේන / ලඳු කැලෑ) (ල.01)

(iii) අංක 3 න් දක්වා ඇත්තේ කුමක් ද?

(වැලිතලාව / වේල්ල / අභයභූමි මායිම) (ල.01)

(iv) අංක 4 න් දක්වා ඇත්තේ කුමක් ද?

(අක්ෂාංශ වටිනාකම් / තැන් උස / බණ්ඩාංක වටිනාකම්) (ල.01)

(v) AB44 මාර්ගයේ දිග ආසන්න වශයෙන් කිලෝමීටර් කීයද? (ල.01)

(vi) K වලින් දක්වා ඇති චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතනය කුමක් ද?(ල.01)

(vii) සිතියම් ප්‍රදේශයේ බහුලවම ව්‍යාප්තව ඇති කෘෂිකාර්මික භූමි පරිභෝගය කුමක් ද? (ල.01)

- **සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් ''නි'' යන්න ද වැරදි නම් ''වැ'' යන්නද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.**

(viii) ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සිදු කෙරෙන්නේ ජල සම්පාදනය මගිනි. (ල.01)

(ix) අංක 6 න් පෙන්නුම් කෙරෙන්නේ පළාත් මායිමකි. (ල.01)

(x) X අක්ෂරයෙන් පෙන්වන්නේ ජාතික බණ්ඩාංක රේඛා ඡේදනය වන ස්ථානයකි. (ල.01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.

- **අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරිදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.**

(i) ඉන්දු ගඟ - A, B, C

(ii) යූරල් කඳු වැටිය - D, E, F

(iii) ඕකොට්ස් මුහුද - G, H, J

(iv) මෙක්සිකෝ සානුව - K, L, M

(v) නයිජීරියාව - P, Q, R

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න.

- **අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂරය තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.**

(i) තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය - A, B, C

(ii) ආරුගම්බේ - D, E, F


(iii) ඇලහැර - G, H, J

(iv) ඉඟිනිමිටිය ජලාශය - K, L, M

(v) ගම්පහ නගරය - P, Q, R

## II කොටස

(02) යාබද රූපයෙන් දක්වා ඇත්තේ පෘථිවි ව්‍යුහ බෙදෙන ප්‍රධාන ස්ථර තුනයි.





(i) රූප සටහනේ අංක 1 හා 2 න් දක්වා ඇති ස්ථර දෙක නම් කරන්න. (ල.02)

(ii) (a) අංක 2 හා 3 ස්ථර වෙන් කෙරෙන සීමාව හඳුන්වන නම කුමක් ද?

(b) අංක 3 ස්තරයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල.03)

(iii) අංක 1 ස්තරයේ ඇති, සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ දී එම ස්තරයට එල්ලවන බලපෑම් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(03) යාබදව ඇත්තේ ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවන් දැක්වෙන රූප සටහනකි.




(i) අංක 2 හා 3 න් පෙන්නුම් කෙරෙන මුහුදු සීමාවන් දෙක නම් කරන්න. (ල.02)

(ii) (a) අංක 04 න් පෙන්නුම් කෙරෙන මුහුදු කොටස සඳහන් කරන්න.

(b) එම මුහුදු කොටසට අයත් වන ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ල.03)

(iii) (a) අංක 1 න් පෙන්නුම් කෙරෙන මුහුදු සීමාව කුමක් ද?

(b) ඊට අයත්වන දුර ප්‍රමාණය කොපමණ ද?

(c) ඉහත (a) හි ඔබ සඳහන් කළ මුහුදු සීමාවේ ඇති වැදගත්කම කරුණු දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(04) (i) ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ල.02)

(ii) (a) වී වගාව සඳහා අවශ්‍ය භෞතික සාධකයක් හා

(b) වී වගාවේ විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ල.03)

(iii) ශ්‍රී ලංකාවේ වී ගොවියා මුහුණපාන ගැටළු තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

(05) (i) කර්මාන්තයක් ස්ථානගතවීම කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටි රටවල් නිවැරදිව සඳහන් කරන්න.

a) ඔසාකා

b) දකුණු මැන්චූරියා

c) පිට්ස් බර්ග් (ල.03)

(iii) a) යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

b) ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත හේතුවෙන් පැන නැගී ඇති පාරිසරික ගැටළු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(06) (i) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න. (ල.02)

(ii) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයට හිතකර භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) a) කරදිය ධීවර කර්මාන්තයේ දී මසුන් ඇල්ලීම සඳහා යොදා ගන්නා ආම්පන්න දෙකක් සඳහන් කරන්න.

b) ධීවර කර්මාන්තයේ නියැලෙන ශ්‍රී ලාංකික ධීවරයා මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(07) (i) ලෝකයේ වැඩිම ජන සංඛ්‍යා ව්‍යාප්තියක් ඇති මහාද්වීප දෙක සඳහන් කරන්න. (ල.02)

(ii) ලෝකයේ,

a) ප්‍රධාන ජන සංකේන්ද්‍රණයක්,

b) ද්විතීයික ජන සංකේන්ද්‍රණයක් හා

c) ජන හීන ප්‍රදේශයක් සඳහන් කරන්න. (ල.03)

(iii) a) ජන සංඛ්‍යා ව්‍යුහය සමන්විත වන ප්‍රධාන අංශ දෙක සඳහන් කරන්න.

b) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ කැපීපෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)


(08) (i) ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර ගුවන් තොටුපලක් හා ජාත්‍යන්තර වරායක් සඳහන් කරන්න. (ල.02)

(ii) a) ශ්‍රී ලංකාවේ මහාමාර්ග සංවර්ධනය,

b) ගුවන්තොටුපල සංවර්ධනය හා

c) වරාය සංවර්ධනය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න. (ල.03)


(iii) ශ්‍රී ලංකාව තුළ අධිවේගී මාර්ග තැනීම නිසා අත් වූ යහපත් ප්‍රතිඵල තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)




(i) (ii) (iii) (iv) (v)

5

01 (ඉ) / (C)




(i) (ii) (iii) (iv) (v)

5

01 (අ) (A) $\frac{}{10}$ + (ආ) (B) $\frac{}{5}$ + (ඉ) (C) $\frac{}{5}$ = $\frac{}{20}$

භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

ශ්‍රේණිය/Grade : ......................

විභාග අංකය
சுட்டெண்
**Index Number** ......................................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (අ) (A)

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

(vi) ..............................................................................................

(vii) ..............................................................................................

(viii) ..............................................................................................

(ix) ..............................................................................................

(x) ..............................................................................................

10

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ග්‍රැනයිට් | 11 | කේතුධර | 21 | 3 | 31 | 1 |
| 02 | මෙසෝ | 12 | ඇලුමිනියම් | 22 | 2 | 32 | 2 |
| 03 | ආසියා | 13 | ලැටරයිට් | 23 | 1 | 33 | 3 |
| 04 | දියළු පස | 14 | ලෝහමය | 24 | 1 | 34 | 4 |
| 05 | ඉන්දියාව | 15 | රතු | 25 | 2 | 35 | 4 |
| 06 | නි | 16 | හත (7) | 26 | 3 | 36 | 3 |
| 07 | වැ | 17 | 2017 | 27 | 4 | 37 | 2 |
| 08 | වැ | 18 | 2014 | 28 | 4 | 38 | 1 |
| 09 | නි | 19 | 2016 | 29 | 3 | 39 | 2 |
| 10 | නි | 20 | 4 | 30 | 2 | 40 | 3 |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II පත්‍රය
### I - කොටස

(01) (අ) (i) ගල (ii) තණ බිම (iii) අභය භූමි මායිම (iv) තැන් උස
(v) 12 km (vi) පාසල (vii) වී (viii) නි (ix) නි (x) වැ

(ආ) (i) A (ii) E (iii) J (iv) L (v) P

(ඉ) (i) B (ii) F (iii) G (iv) L (v) P

### II කොටස

(02) (i) 1 - කබොල 2 - ප්‍රාවරණය (ල.02)

(ii) (a) ගුටෙන් බර්ග් අසන්තතිය

(b)
- ★ පිටත හරය හා ඇතුළත හරය වශයෙන් කොටස් දෙකකි.
- ★ ඝනත්වයෙන් වැඩිම ස්තරයයි.
- ★ යකඩ, නිකල්, ක්‍රෝමියම් වැනි ඛනිජ වලින් සමන්විතයි.
- ★ පිටත හරය ද්‍රව ස්වභාවයෙන් ද ඇතුළත හරය ඝන ස්වභාවයෙන් ද පවතී. (ල.03)

(iii)
- ★ භූ දර්ශනය වෙනස්වීම (ආවාට, ගොඩැලි ඇතිවීම)
- ★ ගිලා බැසීම් ඇතිවීම.
- ★ පාංශු ඛාදනයට ලක්වීම
- ★ කැළි කසළ බැහැර කිරීම නිසා කබොලේ සංයුතිය වෙනස්වීම. (ල.05)

(03) (i) 2 - යාබද කලාපය 3 - පරම ආර්ථික කලාපය (ල.02)

(ii) (a) ඓතිහාසික ජල ප්‍රදේශය

(b) ★ මන්නාරම් ස.ස. ★ පෝක් ස.ස. ★ බෙංගාල බොක්ක (ල.03)

(iii) (a) රාෂ්ට්‍රීය මුහුදු සීමාව (ල.01) (b) නා.සැ. 12 (ල.01)

(c) ★ රටේ ආරක්ෂාවට ★ එහි ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීම
★ සංචාරක කර්මාන්තයට ★ ධීවර කර්මාන්තයට (ල.03)

(04) (i) ★ උතුරු ඇමරිකාවේ සැක්‍රමැන්ටෝ සහ පහළ මිසිසිපි නිම්නය ★ බ්‍රසීලයේ නැගෙනහිර වෙරළ ★ ඉතාලියේ පෝ ගංගා නිම්නය ★ ඊජිප්තුවේ නයිල් ඩෙල්ටාව ★ ඕස්ට්‍රේලියාවේ මරේ-ඩාලිං නිම්නය (ල.02)

(ii) (a) ★ $27^0C$ පමණ උෂ්ණත්වය ★ 2000 mm පමණ වර්ෂාපතනය ★ දියළු පස ★ තැනිතලා ප්‍රදේශ

(b) ★ කුඩා බිම් වල වගා කිරීම ★ ශ්‍රම සූක්ෂම වගාවක් වීම ★ ඇතැම් රටවල් වානිජ පදනමකින් වගා කිරීම ★ වර්තමානයේ ඓන්ද්‍රීය පොහොර භාවිතය (ල.03)

(iii) ★ පොහොර හිඟය ★ වන සතුන්ගෙන් එල්ලවන බලපෑම් ★ වී මිල පහළ යාම ★ යෙදවුම් වල මිල ඉහළ යාම ★ කුඹුරු ඉඩම් ගොඩ කිරීම (ල.05)

(05) (i) ★ අමුද්‍රව්‍ය ★ ශ්‍රමය ★ බලශක්තිය ★ වෙළඳපොළ ★ ප්‍රාග්ධනය ★ ප්‍රවාහනය
★ යටිතල පහසුකම් ★ රාජ්‍ය ප්‍රතිපත්ති (ල.02)

(ii) (a) ජපානය (b) චීනය (c) ඇ.එ.ජ. (ල.03)

(iii) (a) ⋆ වෙනත් ලෝහ සමඟ මිශ්‍ර කළ හැකිවීම. ⋆ භාවිතයෙන් ඉවත් කළ පසු ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි වීම. ⋆ මූලික ලෝහ වර්ගයක් ලෙස සෑම රටක්ම යොදා ගැනීම. ⋆ යකඩ හා වානේ වල ඇති විවිධ ගුණ ⋆ පාරම්පරික තාක්ෂණය ඉවත් වී නිෂ්පාදන කටයුතු නවීකරණය වීම ආදී., (ල.02)

(b) ⋆ ගොඩබිම, වායු, ජලය හා සාගර පත්ල දූෂණය වීම.
⋆ රසායනික පොහොර, රසායනික ද්‍රව්‍ය හා හෝර්මෝන වර්ග භාවිතය නිසා සමහර ශාක හා සතුන් වඳවීම හා නව ශාක හා සත්ව විශේෂ බිහිවීම.
⋆ කාර්මික අපද්‍රව්‍ය මුදා හැරීමේ ගැටළුව.
⋆ බැර ලෝහ අංශු ජෛව පද්ධතියට එක්වීම.
⋆ අම්ල වැසි ඇතිවීම.... ආදී, (ල.03)

(06) (i) ⋆ වෙරළාසන්න (මහාද්වීපික තටාකයේ) ධීවර කර්මාන්තය ⋆ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය (ල.02)

(ii) ⋆ සාගරයෙන් වට වූ දූපතක් වීම. ⋆ දිවයින වටා දිගු වෙරළ තීරයක් පැවතීම. ⋆ නොගැඹුරු මහාද්වීපික තටකය ⋆ මත්ස්‍ය ආහාර බහුල වීම. ⋆ කඩතොළු සහිත වෙරළ තීරය (ල.03)

(iii) (a) ⋆ වීසි දැල් ⋆ මාදැල් ⋆ රිටි පන්න ⋆ ත්‍රිත්ව දැල් ⋆ කරමල් දැල් ⋆ බහුදින යාත්‍රා (ල.02)

(b) ⋆ ඉන්ධන සහනාධාර ලබා දීම. ⋆ ධීවරයින් හා ආම්පන්න රක්ෂනය කිරීම. ⋆ ණය හා ආධාර ලබාදීම. ⋆ ධීවර පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී, (ල.03)

(07) (i) ⋆ ආසියා මහාද්වීපය ⋆ අප්‍රිකා මහාද්වීපය (ල.02)

(ii) (a) ⋆ නැගෙනහිර ආසියාව ⋆ දකුණු ආසියාව
⋆ අග්නිදිග ආසියාව ⋆ වයඹ දිග යුරෝපය, මින් එකක් (ල.01)

(b) ⋆ උතුරු ඇමරිකාවේ නැගෙනහිර, බටහිර හා ඊසාන දිග වෙරළ බඩ කලාපය
⋆ දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළ බඩ කලාපය
⋆ නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය.
⋆ බටහිර අප්‍රිකාවේ සියෙරා ලියෝන්, ලයිබීරියාව, අයිවරි කෝස්ට්, ඝානාව යන රටවල් ආශ්‍රිත කලාපය. මින් එකක්, (ල.01)

(c) ⋆ ආක්ටික් හා ඇන්ටාක්ටික් (ශීත කාන්තාර) ප්‍රදේශ
⋆ සහරා, මධ්‍යම ඕස්ට්‍රේලියාව (උෂ්ණ කාන්තාර) ප්‍රදේශ
⋆ කඳුකර (හිමාලය, ඇන්ඩීස්, රොකී) ප්‍රදේශ
⋆ නිවර්තන වර්ෂා වනාන්තර (ඇමර්සන්, කොංගෝ) ප්‍රදේශ (ල.01)

(iii) (a) ⋆ ස්ත්‍රී පුරුෂ බව ⋆ වයස් ව්‍යුහය (ල.02)

(b) ⋆ පුරුෂ ජන සංඛ්‍යාව අභිබවා ස්ත්‍රී ජන සංඛ්‍යාව වැඩිවීම. ⋆ වියපත් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීම. ⋆ බාල වයස් යැපෙන්නන් ක්‍රමයෙන් අඩුවීම. ⋆ ශ්‍රම බලකාය අඩුවීම. (ල.03)

(08) (i) ⋆ ජාත්‍යන්තර ගුවන් තොටුපල - කටුනායක / මත්තල / රත්මලාන / පලාලි
⋆ ජාත්‍යන්තර වරාය - කොළඹ / හම්බන්තොට / ත්‍රිකුණාමලය / ගාල්ල (ල.02)

(ii) (a) ⋆ නව මාර්ග ඉදිරකිරීම ⋆ අධිවේගී මාර්ග ⋆ මහාමාර්ග පුළුල් කිරීම ආදී, (ල.01)

(b) ⋆ කටුනායක ගුවන් තොටුපල පුලුල් කිරීම ⋆ අභ්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධනය ⋆ හදිසි අවශ්‍යතා සඳහා සේවා පහසුකම් පුලුල් කිරීම ආදී, (ල.01)

(c) ⋆ කොළඹ වරාය, ඔලුවිල් වරාය වැඩි දියුණු කිරීම ⋆ කොළඹ දකුණු වරාය ඉදිකිරීම ⋆ බහාලුම් මෙහෙයුම් වැඩි කිරීම ආදී, (ල.01)

(iii) ⋆ ගමනාන්තය කරා ඉක්මනින් ළඟාවිය හැකිවීම. ⋆ ගතවන කාලය අඩුවීම. ⋆ භාණ්ඩ ප්‍රවාහනය ඉක්මන් වීම. ⋆ භෞතික දුර අඩුවීම. ⋆ මාර්ග අනතුරු අඩුවීම. ⋆ නව ප්‍රදේශ සංවර්ධනය වීම ආදී, (ල.05)